“කවරෙකු අල්ලාහ්ගේ පුස්තකයෙන් එක් අකුරක් කියවන්නේ ද ඔහුට කුසලක් හිමිය. එම කුසල ඒ හා සමාන දහයකින් යුක්තය

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. “කවරෙකු අල්ලාහ්ගේ
පුස්තකයෙන් එක් අකුරක් කියවන්නේ ද ඔහුට කුසලක් හිමිය. එම කුසල ඒ හා සමාන දහයකින් යුක්තය. අලිෆ් ලාම් මීම් යන්න එක් අකුරක් බව නොකියමි. එනමුත් අලිෆ් අකුරකි; ලාම් අකුරකි; මීම් අකුරකි.”
[حسن] [رواه الترمذي]

අල්ලාහ්ගේ පුස්තකයෙන් එක් අකුරක් හෝ කියවන මුස්ලිම්වරයාට කුසලක් හිමි බවත් එය ඒ හා සමාන කුසල් දහයක් දක්වා ඔහුට ගුණ කර දෙන බවත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දන්වා සිටියහ. "අලිෆ් ලාම් මීම් යන්න එක් අකුරක් බව නොකියමි. එනමුත් අලිෆ් අකුරකි; ලාම් අකුරකි; මීම් අකුරකි.” යනුවෙන් පවසා එතුමාණෝ එය පැහැදිලි කළහ. එහෙයින්, එහි ඇති අකුරු තුන සඳහා කුසල් තිහකි.

http://sunnah.global/hadeeth/si/show/6275